ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. HRC/3013/19 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022-09-08 |

පැමිණිලි පාර්ශවය : ජේ. ශාන්තිනි මිය,
1/A F/9 U/36,සිරිසර උයන,
බේස්ලයින් පාර, කොළඹ 08.

වගඋත්තර පාර්ශවය : 01. විදුහල්පති,
නාලන්දා විද්‍යාලය,
කොළඹ 10.
02. ව්‍යාපෘති අධ්‍යක්ෂ,
නාගරික සංවර්ධන අධිකාරිය,
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

**පැමිණිලි අංකය : එච්ආර්සි/3013/19**

## පැමිණිල්ල

පෙත්සම්කාරිය ඇයගේ දරුවා වගඋත්තරකාර කොළඹ නාලන්දා විද්‍යාලයට ගෘහ මූලික පදනම යටතේ 2020 පළමු ශ්‍රේණියට ඇතුලත් කිරිම සඳහා යොමු අංක CO/240 යටතේ අයදුම්පත් ඉදිරිපත් කල බව කියා සිටියි.

කෙසේ වෙතත් වගඋත්තරකාර විදුහල්පති විසින් පෙත්සම්කාරියට 2019-07-29 දිනැති ලිපියෙන් දැනුවත් කරන ලද්දේ ශිර්ෂගත කරුණු සම්බන්ධයෙන් මෙම විද්‍යාලය වෙත යොමු කර තිබූ අයදුම්පත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ මූලික පරීක්ෂාවට ලක් කරන ලද අතර, සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා නොතිබීම සහ ආගම් අනුපාතය අනුව මෙම විද්‍යාලය සඳහා පුරප්පාඩු නොමැති වීම යන හේතු මත පෙත්සම්කාරියට සම්මුඛ පරීක්ෂණයට නොකැඳවීමට තිරණය කල බවත්ය.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com

**<u>බලාපොරොත්තු වූ සහනය :</u>**

පෙත්සම්කාරිය ඇයගේ දරුවා කොළඹ නාලන්දා විද්‍යාලයේ අදාල ශ්‍රේණියට ඇතුලත් කර දෙන මෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් සහන වශයෙන් අයැද සිටී.

මෙම කාරණා පිළිබඳව කොමිෂන් සභාව විසින් 2019-11-04 වන දින 2020-09-28 දින, 2021-03-16 යන දිනයන් හී පරීක්ෂණ සිදු කර ඇත. එකී පරීක්ෂණයන් හී පෙත්සම්කාරිය වෙනුවෙන් පෙනී සිටි ඇයගේ නියෝජිතවරයා පවසා සිටින්නේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් නාගරික පුනර්ජීව ව්‍යාපෘතිය යටතේ කොළඹ 08, බොරැල්ල, සිරිසර උයන මහල් නිවාස සංකීර්ණයේ 1/F 9/U36 දරණ නිවාස පෙත්සම්කාරියට 2014 වර්ෂයේ භාර දුන් බවට ලිපියක් ලබා දුන් බවත්, වාරික ගෙවීම් පදනම මත එම නිවාස ලබා දී තිබුණු බවත්, පෙත්සම්කාරියගේ වැඩිමහල් දරුවා වූ කේ. ලසිදු පළමු ශ්‍රේණියට ඇතුලත් කිරීම සඳහා කොළඹ නාලන්දා විද්‍යාලයට අයදුම්පත්‍රයක් සහ අදාල ලිපිලේඛණ ඉදිරිපත් කල බවත්, ඒ සඳහා ලබා දුන් යොමු අංකය CO/240 බවත්, අදාල සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමක් නොලැබුණු අතර, ඒ පිළිබඳව වාචිකව හා ලිඛිතව වගඋත්තරකාර විදුහලේ විදුහල්පතිවරයා දැනුවත් කල අතර, විදුහල්පති හමු වූ අවස්ථාවේදී ඔහු විසින් පවසා සිටින ලද්දේ නාගාරික සංවර්ධන අධිකාරිය මගින් 2018-10-01 දින ලබා දී තිබූ වාරික සින්න ගිවිසුමේ දෙවන ජේදයේ අදාල දිනය අන්තර්ගතය නොමැති වීම හේතුවෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා අවස්ථාව ලබා නොදුන් බවද ප්‍රකාශ කර සිටි අතර, පසුව මෙම ගැටළුව පිළිබඳව නැවත වතාවක් නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ දැනුවත් කලද මෙම ගැටළුව නිවැරදි කර දෙන ලෙසට ඉල්ලා සිටි අතර, නිවැරදි කර එම දාතමින් වාරික සින්න ගිවිසුම ලබා දෙන බවත්ය.

තවද මේ සමගම නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් ඔහුගේ අංක URP/CC/01/Re/WAL/1152 සහ 2019-10-09 දිනැති ලිපියෙන් පෙත්සම්කාරියගේ පදිංචිය තහවුරු කිරීම පිණිස ලිපියක් ලබා දෙන ලදි. කෙසේ වෙතත් එකී ලිපිය ලබා දී තිබෙන්නේ පෙත්සම්කාරියගේ ඉල්ලීමෙන් දින 09යකට පසුවය.

මෙම පෙත්සම පිළිබඳව 2019-11-04 දින පැවැත් වූ පරීක්ෂණයේදී වගඋත්තරකාර පාසලේ සහකාර විදුහල්පති ජගත් අමරසිංහ මහතා පවසා සිටින ලද්දේ පෙත්සම්කාරිය ඇයගේ දරුවා 2020 වසරේ පළමු ශ්‍රේණියට ඇතුලත් කිරීමේ අයදුම්පත්‍රය සියළු ලිපිලේඛණ සමග 2019-06-30 හෝ එදිනට පෙර පාසලට එවිය යුතු අතර, එවන ලද ලේඛණයක් වන සිරිසර උයන නිවාස ව්‍යාපෘතියේ වාරික සින්න ගිවිසුමේ පැමිණිලිකාරියට අදාළ ඔප්පුවෙහි දින වකවාණුව සටහන් වී නොමැති බවත්, සම්මුඛ පරීක්ෂණයේ මූලික ලියවිල්ලක් වන පදිංචි ලේඛණයේ දින වකවාණුව නොමැති වීම ගැටළුකාරී තත්වයක්ද එම අඩුපාඩු නිසා පෙත්සම්කාරියගේ අයදුම්පත්‍රය 29/2019 චක්‍රලේඛණය අනුව ප්‍රතික්ෂෙප කිරීමට කටයුතු කර ඇති බවත්ය.

මෙම ප්‍රතික්ෂේප වීම පිළිබඳව 2019-07-29 වන දින පැමිණිලිකාරිය වෙත පාසල මගින් දැනුම් දී ඇති බවත්ය. තවද පෙත්සම්කාරිය මෙම ප්‍රතික්ෂේප ලිපිය ලැබී සතියක් තුළ අයදුම්පත්‍රය නැවත සලකා බැලීම සඳහා අභියාචනාවක් ද පාසල වෙත ඉදිරිපත් කර නොමැති බවත්ය. පෙත්සම්කාරිය මෙම ගැටළුව පිළිබඳව කතා කිරීමට පාසලට නැවත පැමිණ ඇත්තේ 2019-10-05 වන දිනය වේ. ඒ වන විට පළමු ශ්‍රේණියට දරුවන් ඇතුලත් කර ගැනීමේ කටයුතු අවසන් කර ඇති බවද. වගඋත්තරකරු පවසා සිටියි.

<u>නිරීක්ෂණ</u>

මෙම පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු වූයේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන නාගරික පුනර්ජීව ව්‍යාපෘතිය යටතේ සිරසරඋයන ව්‍යාපෘතියේ 1 A/F9/H 36 දරණ නිවාස ඒකකය පෙත්සම්කාරියට 2018-10-01 වන දින ලබා දී තිබුණත් එම සින්න ගිවිසුමෙහි දින වකවාණුවක් සටහන් වී නොමැති වීමයි.

මෙම කාරණා පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියෙන් විමසීම ඉතා වැදගත් කරුණක් බව කොමිෂන් සභාවේ මතය විය. එබැවින් 2021-03-16 වෙනි දින පැවැත් වූ පරීක්ෂණය සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට ද සිතාසි යොමු කල අතර, ඔහු වෙනුවෙන් එකී ආයතනයේ නීති නිලධාරි පී. එස්. ආර්. ඊ. සමරදූවාකර මහත්මිය සහ බලයලත් නිලධාරි බී. එන්. එම්. රත්නායක මහතා ද පෙනී සිටියි. එම පරීක්ෂණයේදී නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරින් පවසා සිටියේ මෙම පෙත්සමේ පෙත්සම්කාරියට රජයේ ප්‍රතිපත්තිමය මත නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2018-10-01 වන දින අධිකාරිය වෙනුවෙන් නිසි බලධාරි වශයෙන් අධ්‍යක්ෂ ජනරාල් හා සභාපති හා ඊට අදාල සාක්ෂිකරුවන් මෙන්ම පෙත්සම්කාරිය වෙනුවෙන් ඇය ද ඇයගේ සාක්ෂිකරුවන් අත්සන් කරමින් මෙම නිවාස ඒකකය වෙන් කිරීමට අදාල චාරික සින්න ගිවිසුම අත්සන් තබන ලද බවත්, නීත්‍යාණුකූල හිමිකරු වශයෙන් සින්නක්කර හිමිකරුවන්ට ඔප්පු පිරිනමන තෙක් යම් කිසි අවශ්‍යතාවයකට නිවාසලාභින්ගේ හිමිකම් පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියෙන් ලිඛිතව ඉල්ලීම් සිදු කල යුතු අතර, අධිකාරිය විසින් එකී ඉල්ලීම පරිදි ලේඛණ ලබා දෙන බව නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරින් පවසන ලදි.

කරුණු එසේ තිබියදී පෙත්සම්කාරියගේ අයදුම්පත්‍රය වගඋත්තරකාර පාසල විසින් කිසිදු සැලකිමකින් තොරව ප්‍රතික්ෂේප කිරීම සාධාරණ සහ යුක්ති සගහත ක්‍රියාවක්ද යන්න පිළිබඳව ගැටළුවක් මතුවේ. එකී ගැටළුව පිළිබඳව තවදුරටත් සොයා බැලීමේදී පෙනී යන්නේ පෙත්සම්කාරිය විසින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 29/2019 චක්‍රලේඛණයේ ප්‍රකාරව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට යැවිය යුතු සියලු ලේඛණ යවා තිබූ අවස්ථාවක එම ලේඛණ අතරින් එක් ලේඛණයක දිනයක් පමණක් නැති වීම පදනම් කරගෙන පෙත්සම්කාරියගේ අයදුම්පත්‍රය මුළුමනින්ම ප්‍රතික්ෂේප කිරීම සාධාරණ නොවේයැයි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මතය වේ.

නිවාස සංවර්ධන අධිකාරිය මගින් පෙත්සම්කාරිය ලග තිබූ ලේඛණයේ දිනයක් සඳහන් නොවීම පෙත්සම්කාරියගේ වැරද්දකින් සිදු නොවූ අතර, නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරින්ගෙන් යම් අතපසුවීමකින් සිදු වී ඇති අඩුපාඩුවක් වේ. එකී අඩුපාඩුවට පෙත්සම්කාරිය විසින් වන්දි ගෙවීම සාධාරණ නොවන බව කොමිෂන් සභාවේ මතයක් වේ.

තවද එම අඩුපාඩුව පෙත්සම්කාරිය විසින් හැකිතාක් ඉක්මණින් නිවැරදි කිරීමට කටයුතු කර ඇති බවද මනා ලෙස පැහැදිලි වේ.

ඉහත කී සියලු කරුණු කාරණා පරීක්ෂා කර බැලීමේදී පෙනී යන්නේ පෙත්සම්කාරියට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ සහ ඉන් අනතුරුව අවශ්‍ය නම් අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩල ඉදිරියේ පෙනී සිටීමට තිබූ අයිතිය වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බව කොමිෂන් සබාවේ නිගමනය වේ.

දරුවෙකුගේ අධ්‍යාපනය පිළිබඳව එකී දරුවා සහ දෙමාපියන් කැමැති පාසලක් තෝරා ගැනීමේදී බලධාරින් මීට වඩා වගකීමෙන් කටයුතු කිරීම අනවශ්‍ය කාරණයක් වේ.

මෙම පෙත්සම පිළිබඳව පරීක්ෂණ කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික පුනර්ජීව ව්‍යාපෘතිය කොළඹ නගරයේ ව්‍යාපෘති අධ්‍යක්ෂක බ්‍රිගේඩියර් එස්.ඒ.ආර්. සමරසිංහ යන අය විසින් ලබා දී තිබූ මගේ අංකය " URP-CC/01/RE/WAN/1152 සහ 2019-10-09" දිනැති ලිපිය වැදගත්ම සාධකයක් වේ. එකී ලිපිය වගඋත්තරකරුවන්ට භාර දී තිබුණත්, එම ලිපිය වගඋත්තරකරු විසින් ප්‍රතික්ෂේප කිරීම සාධාරණ සහ යුක්තිගරුක ක්‍රියාවක් නොවන බව කොමිෂන් සභාවේ මතය වේ.

<u>නිගමනය</u>

මෙම සමස්ථ කරුණු අනුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන පරිච්ඡේදයේ 12(1) වගන්තියේ සඳහන් නීතිය ඉදිරියේ සමානත්වයෙන් සැලකීමේ අයිතිය වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

<u>නිර්දේශය</u>

පෙත්සම්කාරිය විසින් වගඋත්තරකාර පාසලට ඉදිරිපත් කර ඇති ලේඛණ නැවත වතාවක් පරීක්ෂණයට ලක් කර පෙත්සම්කාරිය 29/2019 චක්‍රලේඛය ප්‍රකාරව වගඋත්තරකාර පාසලට අදාල වසරේ ගෘහ මූලික පදනම මත ළමුන් ඇතුලත් කර ගන්නා වූ කඩයිම් ලකුණු මට්ටමට ලගා වීමට හැකියාව තිබේනම් පෙත්සම්කාරියගේ දරුවා ඇතුලත් විය යුතු නියමිත ශ්‍රේණියට ඇතුලත් කිරීමට කටයුතු කල යුතු බවට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් විදුහල්පති, නාලන්දා විද්‍යාලයට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022.10.10 වන දිනට පෙර එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධ පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ. නිමල් කරුණාසිරි
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත = 01. අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්, - ඉහත නිර්දේශය අනුව කටයුතු තිරීමට.
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.